# <u>රාජ්‍ය චිත්‍ර මූර්ති උලෙළ - 2024</u>

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, ශ්‍රී ලාංකේය සංස්කෘතියේ යහපැවත්ම, සුසංයෝගය සහ ප්‍රවර්ධනය උදෙසා විවිධ සංස්කෘතික වැඩසටහන් ක්‍රියාත්මක කරන අතර, මෙම රාජ්‍ය චිත්‍ර හා මූර්ති උලෙළ ද එහි වැදගත් අංගයකි. එහිදී දේශීය චිත්‍ර හා මූර්ති කලාවේ සමකාලීන ප්‍රවණතා හඳුනා ගැනීමට ද, උක්ත විෂයෙහිලා කළ යුතු සාධනීය මැදිහත්වීම් සඳහා බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව සහ රාජ්‍ය දෘශ්‍ය කලා උපදේශක සභාව මගින් සංවිධානය කරනු ලබන, රාජ්‍ය චිත්‍ර මූර්ති උලෙළ - 2024 සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. 2024 මාර්තු මස 20 වෙනි දින සිට ජූලි මස 25 වෙනි දින දක්වා අයදුම්පත්‍ර භාර ගැනීමට නියමිතය.

සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය සමඟ ඔබ විසින් අප වෙත එවීමට නියමිත නිර්මාණය, චිත්‍ර නිර්මාණයක් වේ නම් එම නිර්මාණයේ පැහැදිලි ඡායාරූප 02ක් සහ පාස්පෝට් ප්‍රමාණයේ ඔබගේ ඡායාරූපයක් ද, මූර්ති සහ ස්ථාපන නිර්මාණයක් නම් ඉදිරිපසින්, පිටුපසින් හා දෙපසින් ගත් ඡායාරූප 04 ක් සහ පාස්පෝට් ප්‍රමාණයේ ඔබගේ ඡායාරූපයක් ද (ඡායාරූප **300dpi resolution**) ඇතුළත් කරන ලද සංයුක්ත තැටියක් මගින් පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාරදිය යුතුය. **ලේකම්, රාජ්‍ය දෘශ්‍යකලා උපදේශක සභාව, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, 8 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල**. ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ **"රාජ්‍ය චිත්‍ර මූර්ති උලෙළ - 2024 "** ලෙස සඳහන් විය යුතුය. (එම සංයුක්ත තැටියේ අඩංගු සියලුම තොරතුරු statevisualartboard@gmail.com යන විද්‍යුත් තැපෑලට ද එවිය යුතුය.)

එවනු ලබන නිර්මාණ ප්‍රවීණ විනිසුරු මඩුල්ලක් විසින් විනිශ්චය කටයුතු සිදු කරනු ලැබේ. තෝරාගන්නා ලද නිර්මාණවල මුල් කෘතිය අප විසින් දැනුම් දෙනු ලබන දිනයක් තුළ කොළඹ 07, ජාතික කලා භවන වෙත ප්‍රදර්ශනයට සුදුසු මට්ටමින් සකසා ගෙනවිත් භාරදිය යුතු වේ. එම තෝරාගනු ලබන සියලුම නිර්මාණ ප්‍රවීණ විනිසුරු මඩුල්ලක් මගින් නැවත විනිශ්චය කරනු ලැබේ. ජයග්‍රාහකයින් සඳහා සම්මාන, සහතික සහ මුදල් ත්‍යාග ප්‍රදානය කරන අතර ජයග්‍රාහී නිර්මාණ පමණක් රාජ්‍ය චිත්‍ර මූර්ති උලෙළ - 2024 ප්‍රදර්ශනය සඳහා ඉදිරිපත් කරනු ලැබේ.

**<u>තරග අංශ</u>**

1. **<u>චිත්‍ර - Painting</u>**
    - **a)** ආලේඛ්‍ය **- Portrait**
    - **b)** භූමි දර්ශන **- Landscape**
    - **c)** නිර්මාණාත්මක සම්පිණ්ඩන **- Creative Painting** (සැ.යු. - නිර්මාණාත්මක ආලේඛ්‍ය, භූමි දර්ශන ආදිය ද මෙම කාණ්ඩය යටතේ සලකා බලනු ලබයි)
    - **d)** සාම්ප්‍රදායික චිත්‍ර පිටපත් කිරීම **- Traditional Painting** (සිතුවම් පිටපත් කළ ස්ථානය පිළිබඳව කෙටි විස්තරයක් හා මුල් සිතුවමේ ඡායාරූපයක් ඉදිරිපත් කිරීම අනිවාර්ය වන අතර, මුල්කෘතියේ ප්‍රමාණය නිවැරදිව සටහන් කළ යුතුය)

2. **<u>මූර්ති - Sculpture</u>**
    - **a)** ආලේඛ්‍ය **- Portrait**
    - **b)** නිර්මාණාත්මක සම්පිණ්ඩන **- Creative Sculptures** (සැ.යු. - නිර්මාණාත්මක ආලේඛ්‍ය ආදිය ද මෙම කාණ්ඩය යටතේ සලකා බලනු ලබයි)
    - **c)** සාම්ප්‍රදායික මූර්ති **- Traditional Sculptures** (මුල් නිර්මාණය පිළිබඳව කෙටි විස්තරයක් හා මුල් නිර්මාණයේ ඡායාරූපයක් ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ. ඕනෑම ස්ථිර මාධ්‍යයක් භාවිතා කළ හැකිය)

3. **<u>ස්ථාපන කලා - Installation Art</u>**

    ලබාදිය හැකි උපරිම ඉඩ ප්‍රමාණය අඩි 8 x 8 x 8 (දිග, පළල, උස) වේ.

4. **<u>රේඛා චිත්‍ර - Line Drawing</u>**

    රේඛාව මූලික කරගත් හැඩතල සහිත නිර්මාණ මේ යටතට අයත් වේ.

5. **<u>මුද්‍රණ චිත්‍ර කලා - Printmaking Art</u>**
    - **a)** ආලේඛ්‍ය **- Portrait**
    - **b)** නිර්මාණාත්මක සම්පිණ්ඩන **- Creative Printmaking Art**

6. **<u>කාටුන් චිත්‍ර - Cartoons</u>**

    කාටුන් චිත්‍ර සමාජ දේශපාලන ස්වාභාවය ගැඹුරු දිශාවකට ලක්කෙරෙන ආකාරයේ නිර්මාණ විය යුතුය. ප්‍රමාණය අගල් 12 x 8 විය යුතුය.

7. **<u>අභිවාහ කලා - Performance Art</u>**

සෑම තරග අංශයක් සඳහාම පහත සදහන් පරිදි සම්මාන, සහතික පත්‍ර සහ මුදල් ත්‍යාග පිරිනමනු ලැබේ.

- ප්‍රථම ස්ථානය - රු. 40,000.00
- දෙවන ස්ථානය - රු. 30,000.00
- තුන්වන ස්ථානය - රු. 20,000.00
- කුසලතා (10) - රු. 5,000.00 X 10 = රු. 50,000.00

<u>**තරග කොන්දේසි**</u>

**1)** මෙය වයස අවුරුදු 18 ට වැඩි විවෘත තරගයකි.

**2)** 2020 වර්ෂයේ සිට 2023 වර්ෂය අතර කාලයේ නිර්මාණය කළ කලා කෘති පමණක් ඉදිරිපත් කළ යුතුය.

**3)** ඔබ කැමති ඕනෑම තේමාවක් යටතේ නිර්මාණ ඉදිරිපත් කළ හැකිය.

**4)** ඔබ කැමති ඕනෑම වර්ණ මාධ්‍යයක් භාවිතා කළ හැකිය.

**5)** එක් තරග අංශයකින් එක් නිර්මාණයක් පමණක් ඉදිරිපත් කළ හැකිය.

**6)** එකම නිර්මාණයක් තරග අංශ කිහිපයකට යෙදිය නොහැකි අතර අදාල අංශය පැහැදිලිව සඳහන් කළ යුතුය. (ඔබ විසින් ඉදිරිපත් කරන තරග අංශය හා නිර්මාණය අතර නොගැලපීම් ඇතොත් එහි වගකීම ඔබ සතුවනු ඇත)

**7)** ඉදිරිපත් කරන නිර්මාණවල උපරිම ප්‍රමාණය උස - අඩි 8 / පළල - අඩි 8 / දිග - අඩි 8ක් විය යුතුය.

**8)** ඉදිරිපත් කරනු ලබන නිර්මාණයේ දිග, පළල, උස නිවැරදිව සඳහන් කළ යුතුය.

**9)** අයදුම්පත්‍රයෙහි සඳහන් තොරතුරු සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි බසින් නිවැරදිව පැහැදිලි අකුරින් සඳහන් කළ යුතු අතර එම තොරතුරු නිවැරදි හා පැහැදිලි නොවන්නේ නම් සහ අසම්පූර්ණ අයදුම්පත්‍ර, තරගයෙන් ඉවත් කරනු ඇත

**10)** සංයුක්ත තැටියට ඇතුළත් කළ යුත්තේ තරගය සඳහා ඉදිරිපත් කරන නිර්මාණයේ ඡායරූප සහ නිවැරදි ප්‍රමාණයෙන් ලබා ගත් ඔබගේ ඡායාරූපයක් පමණි. නිවැරදි තොරතුරු අඩංගු නොවේනම් එම අයදුම්පත ප්‍රතික්ෂේප වනු ඇත.

**11)** සංයුක්ත තැටියට ඇතුළත් කරන ඡායාරූප අවම වශයෙන් **300dpi resolution** යන ගුණාත්මකභාවයෙන් යුක්ත විය යුතුය.

**12)** එක් එක් තරග අංශ සඳහා වෙන වෙනම සංයුක්ත තැටි ඉදිරිපත් කල යුතු අතර සංයුක්ත තැටියේ පිටුපස නම, ලිපිනය, අත්සන සහ දුරකථන අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.

**13)** පළමු වටයේදී ඔබ විසින් එවනු ලබන නිර්මාණයේ ඡායාරූප ප්‍රවීණ විනිසුරු මඩුල්ලක් වෙත ඉදිරිපත්කර, තෝරාගන්නා නිර්මාණවල මුල් කෘතිය කැඳවා නැවත විනිශ්චයකින් පසු ප්‍රදර්ශනය සඳහා ඉදිපත් කරනු ලැබේ. එම නිර්මාණ නැවත ඔබ වෙත ලබාදෙනු ඇත.

**14)** ප්‍රදර්ශනයෙන් පසුදිනම ප්‍රදර්ශන ශාලාවෙන් ඔබගේ නිර්මාණය ඉවත් කරගත යුතු අතර, ඉවත් කර නොගන්නා නිර්මාණ සඳහා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව වගකියනු නොලැබේ.

**15)** නිර්මාණ භාරදීමේදී, නැවත රැගෙන යාමේදී සහ නිර්මාණ ප්‍රදර්ශනය සඳහා සකස් කරන අවස්ථාවන්හිදී නිර්මාණකරු පැමිණීම අනිවාර්ය වේ.

**16)** විනිශ්චය මණ්ඩලය විසින් ගනු ලබන තීරණ අවසන් තීරණ වේ.

Yasintha Gunawardena
Director
Department of Cultural Affairs
Sethsiripaya, Battaramulla.

යසින්තා ගුණවර්ධන
අධ්‍යක්ෂ
සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

විමසීම්:-
ලේකම්, රාජ්‍ය දෘශ්‍ය කලා උපදේශක සභාව - 0112882551

වැඩිවිස්තර දිවයිනේ සියලුම දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල රාජකාරි කටයුතු සිදුකරනු ලබන සංස්කෘතික නිලධාරින් මගින් සහ **Department of Cultural Affairs Facebook** පිටුවට පිවිසීමෙන් ලබාගත හැක.